**IPRC/16/309**

# පැරණි දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ රෝග නිවාරණ ක්‍රම කිහිපයක් පිළිබඳ අධ්‍යයනයක්

හිරාන් මධුශංක[1*]

ඕනෑම රටක් සතුව ඒ ඒ රටට ආවේනික වූ යම් ශාස්ත්‍ර විශාල ප්‍රමාණයක් පවතී. පරම්පරා ගණනාවක් තිස්සේ පූර්වකාලීනයන්ගේ අත්දැකීම් හා දැනුම මත පදනම් වෙමින් පැවත එන මේ ශාස්ත්‍ර නැවුම් දේ හා නැවුම් අත්දැකීම් සමඟින් තවත් ඉදිරියට විකාශනය වේ. එහෙයින් එය පදනම් වන්නේ ශාස්ත්‍රයනට අත්‍යවශයම වන අත්දැකීම යන සංකල්පය ඔස්සේ ය. වෛද්‍ය ශාස්ත්‍රයේ මූලිකම පදනම වන්නේ ද එකී අත්දැකීම යන්නයි. ලංකාවේ පැරණි දේශිය වෛද්‍ය ශාස්ත්‍රය වෙත වෙනත් රටක හෝ වෙනත් ශාස්ත්‍රයකට හෝ අභියෝග කළ නොහැකි තරමේ පවතින්නා වූ විශේෂිත ශාස්ත්‍රයකි. මූලාශ්‍රය රහිතව වුවත් එය සක්විති රාවණ යුගයට පවා දිව යන්නේ යැයි පවතින මතයයි. නූතනත්වය හෝ තාක්ෂණයෙන් බැහැරව ස්වභාදහමත් සමග ගහට පොත්ත සේ බැඳෙමින් සිදුවන මෙහි කිසිදු අයුරකින් මිනිස් දිවියට හෝ සිරුරට අහිතකර තත්ත්වයක් නොමැත. රෝග නිවාරණය සඳහා ඉදිරිපත් වන්නේ අත්දැකීම් හා ශාස්ත්‍රීය ඥානයත් විවිධ වූ ස්වභාවික ඔසුත් පමණි. ඒ මඟින් එකල පැරණි සමාජයේ පැවැති ඕනෑම රෝගයක් සුවපත් කිරීමට අපේ පැරැන්නෝ අති දක්ෂයෝ වූහ. එසේම සර්වාංග වෙදකම, සර්ප වෙදකම, කැඩුම් බිඳුම් හා යන්ත්‍ර මන්ත්‍ර තවත් බොහෝ දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ වන ඇතුල් අංග වෙයි.

විවිධ වූ රෝගයට විවිධ වූ ප්‍රතිකාර මෙන් ම කෙම් ක්‍රම යන්ත්‍ර මන්ත්‍ර මඟින් සිදු කරන්නා වූ පිළියම් විසඳුම් ද බොහෝ විය. අවට පරිසරය ම භාවිත කරමින් සිදු කරන මෙම දේශීය වෙදකම මගින් මිනිස් සිරුර කුමන හෝ ආකාරයකින් හෝ බල ගැන්විම මිස නූතන බටහිර වෛද්‍ය ක්‍රමය මෙන් හානිදායක නොවීය. බටහිර ක්‍රමයේ මෙන් නොව මෙහි දී එක් රෝගයකට නියම වූ ඔසුවක් වෙනත් ලෙසකින් සිරුරට හිතකර වේ. දේශීය ඥාන සම්භාරය තුළ ගැබ්ව පවතින මේ දේශිය වෛද්‍ය ශාස්ත්‍රය වර්තමානය වන විට දී ප්‍රයෝජනයට ගන්නේ අල්ප වශයෙනි. ඊට ප්‍රධානම හේතුව කාර්ය බහුල දිවියක් ගත කරන්නාවූ මිනිසා බටහිර වෛද්‍ය ක්‍රමයට ඍජුවම හුරු වී සිටීමයි. එහෙයින් දේශිය වෙදකම පසුබා ඇත්තා සේම අදාළ පරම්පරාගත දැනුම ද සැඟව යමින් පවතී. දේශිය වෛද්‍ය ශාස්ත්‍රය නැවත නඟා සිටුවීමට හෝ ඊට එළඹීමට නොහැකි නම් එකී දැනුම් සම්භාරයක උරුමකරුවන් වූ අප ඒ පිළිබඳ යමක් දැන ගැනීම හෝ අගනා කටයුත්තකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මෙකී පාරම්පරික දැනුම හා එකල පැවැති යම් රෝග නිවාරණ ක්‍රම පිළිබඳ එවැනි හඳුන්වාදීමක් සිදු කිරීමත් එය නූතන බටහිර වෛද්‍ය ක්‍රමය හා යම් සැසඳීමක් සිදු කිරීමත් ය. මෙම ක්ෂෙත්‍ර කෙරේ උනන්දු වන අයට එය යම් උත්තේජනයක් වීම, ඒ හරහා ඔවුන්ගේ ගවේෂණය පුළුල් වීම එහි සාධනීය ප්‍රතිඵල වේ. මෙහි අධ්‍යයන ක්‍රමවේද ලෙසින් මූලාශ්‍රය අධ්‍යයනය (පුස්කොළපොත්) හා ක්ෂෙත්‍ර ගවේෂණයත්, පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රයේ යම් පැතිකඩ කිහිපයකුත් ඊට ආශ්‍රය කර ගනු ලබයි.

***ප්‍රමුඛ පද:*** *රෝග, දේශිය ඥාණය, වෛද්‍ය ශාස්ත්‍රය, ස්වභාදහම, බටහිර වෙදකම.*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. *hiran6361@gmail.com